# මානව චින්තනයේ අසහාය අනාවරණය පටිච්චසමුප්පාදයයි.

කොස්වත්තේ අරියවිමල හිමි. (බී. ඒ. ගෞරව, ලංකා) එම්. ඒ. (ලංකා)

## ප්‍රවේශය

නිරවුල් මිනිස් පැවැත්මක් සඳහා මිනිසාට නිවහල් නිවැරදි පිරිපුන් චින්තනයක් අවශ්‍යය. මේ අවශ්‍යතාව සම්පූර්ණ වී නොමැති යුගවල මිනිසා ආධ්‍යාත්මික වශයෙනුත් සාමාජික වශයෙනුත් අවුල් ගොඩ නගාගෙන ඇත. වර්තමානයෙහි තරම් සංකීර්ණ අවුලකට මිනිසා මුහුණ පෑ යුගයක් අප දන්නා ඉතිහාසය තුළ නැතැයි කීම සාවද්‍ය නොවේ. එහි තේරුම නිවැරදි චින්තනයක අවශ්‍යතාව අද විශේෂයෙන් ඇති බවයි. මිනිසාට නිවැරදිව සිතිය නොහැක්කේ කවර බාධක නිසාද? නිරවද්‍ය චින්තනයට ප්‍රබලම බාධකය නම් මමත්වයයි. එය පුද්ගලයා සිතින් නිපදවා ගත්තකි. සිතින් නිපදවූ දේවල් පිළිබඳව සත්‍යතාව විමර්ශනය කළ නොහැකිය. එහෙත් පුද්ගලයා සුව දුක් වශයෙන් අනුභව කරන වින්දන හා අත්දැකීම් අනුසාරයෙන් අනුභෝක්තෘ කෙනෙකු ඇතැයි සිතයි.

වින්දන අනුභවයේ දී ඒ සඳහා මාධ්‍යය වන්නේ චක්ඛු සොතාදී ආයතනයන්ගෙන් සමන්විත කරජ ශරීරයයි. එනිසා ඇතැම්හු ශරීරයම "මම" යයි සිතති. (තං ජීවං තං සරීරං) එහෙත් ශරීරය කිසිවෙකුගේ සැලසුම් කිරීමක් නොවේ. එය ලෝක නියාමයේ සිද්ධියකි. ශරීරය "මම" නොවන්නා සේම එය "මගේ ශරීරය" ද නොවේ. ලෝක නියාමයේ සිද්ධීන්ට අයිතිවාසිකම් කීමක් කළ නොහැකිය. ශරීරයට ජලය හිඟ වීම "මට පිපාසයි" යනුවෙනුත්, ජලය ලැබීම "මම පිපාසය සංසිඳුවා ගනිමි" යනුවෙනුත් සිතන විට වන්නේ භෞතික සිදුවීම් මමත්වයකට පරිවර්තනය වීමය. ශරීරය පිළිබඳ සියලු අත්දැකීම්වල ඇත්තේ මේ ස්වභාවයයි.

එසේ නම් මානසික අංශයට "මම" යයි කිව හැකිද? මානසික අභිසංස්කරණයන් හැඩ ගැසෙන්නේ "මමත්වය" මූලාවක් බව නොදත් කල්හිය. චක්ඛු සොතාදී ඉන්ද්‍රියයන් මඟින් බාහිරාර්ථයන් විජානනය කරන හැම මොහොතකම විවිධ සිතිවිලි ඇතිවෙමින් නැතිවෙමින් පවතියි. එය චිත්ත නියාමයේ ක්‍රියාකාරීත්වයයි. මේ ක්‍රියාමාත්‍රය අකර්තෘක බව දන්නා කල්හි "මමත්වය" සිතින් නිපදවා ගත්තක් බව දැකිය හැකියි. මේ සත්‍යය නොදත් කල්හි මානසික අංශයෙන් සුව දුක් වින්දනයන් මුණගැසෙන විට පුද්ගලයා "මම විඳිමි" යන සිතිවිල්ල නිපදවයි. එතැන් පටන් ක්‍රියාමාත්‍රය මමත්වයට පරිවර්තනය කර ගැනීම සිදු වෙයි. ම. නි. මධුපිණ්ඩික සූත්‍රයෙහි මේ ක්‍රියාවලිය විවරණය වෙයි. ඇසත් රූපත් අතර සම්බන්ධතාව ඇති කල්හි ඇස ඇසුරෙන් සිතක් උපදියි. ( චක්ඛු විඤ්ඤාණං ) මේ සියල්ලේ සම්බන්ධතාව ඇති කල්හි ස්පර්ශය වෙයි. ස්පර්ශය පවත්නා කල්හි වින්දනය ඇතිවෙයි. මෙතෙක් පවතින්නේ ක්‍රියාමාත්‍රයයි. එහත් මේ ක්‍රියාමාත්‍රය නොදකින, මමත්වය කල්පනයක් බව නොදත් පුද්ගලයා එමඟින් වින්දනය, සංජානනය, විතර්කය, ප්‍රපඤ්චකරණය ආදී ප්‍රතික්‍රියාවන් බිහිකරයි. 1. විමුක්ත පුද්ගලයා ඉන්ද්‍රිය ඥානය ලැබුවද පුහුදුන් පුද්ගලයා මෙන් ප්‍රතික්‍රියා බිහි නොකරයි. ප්‍රතික්‍රියාවෙන් තොර වන විට නිෂ්පුද්ගල ක්‍රියාමාත්‍රය යථාභූත වශයෙන් දැකිය හැකි බව නොදත් නිසා ඇති වන අනෙක් දෘෂ්ටියක් නම් ශරීරය මිය ගියද නොමියෙන ආත්මයක් ඇතැයි පිළිගැනීමයි. (අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරං)

මේ අනුව මානසික පැවැත්මත් කායික පැවැත්මත් ලෝක නියාමයේ ක්‍රියාකාරීත්වයයි. එසේ නම් "මම" යයි පැවසිය හැක්කේ කුමකටද? මේ මානසික හා කායික සම්බන්ධතාවෙන් ප්‍රකට වන්නේ නාම- රූප සමවායයි. මමත්වය ඒ සමවායය විෂයෙහි සමාරෝපිත වූවකි. එහෙත් ඒ සමවායය "මම" නොවන්නා සේම එයින් බැහැරව මමත්වයක් අපේක්ෂා කළ හැක්කේද නොවෙයි. මමත්වයට පදනමක් නොමැති මේ පැවැත්ම පිළිබඳ හේතුඵල රටාව පටිච්චසමුප්පාදයයි. ඒ අනුව ලෝකයේ නිරපේක්ෂව ඇති වන, පවතින හා නැතිවන ධර්ම නැත. ඇත්තේ සාපේක්ෂ සමුදයකි සාපේක්ෂ පැවැත්මකි. සාපේක්ෂ නිරෝධයකි. නිරපේක්ෂ ධර්මයක් සම්බන්ධයෙන් කිසිදු හේතුඵල සම්බන්ධතාවක් දැක්විය නොහැකිය. යමක් නිරපේක්ෂ නම් එය තවත් යමක් සමග හේතුඵල වශයෙන් සම්බන්ධ නොවිය යුතුය. නිරපේක්ෂ ධර්මයක් ඇතැයි ගත් විට එහි ආරම්භය හා අවසානය ගැන ගැටළු පැන නගියි. එබඳු ධර්මයක් ආරම්භය පිළිබඳව ගත හැකි වන්නේ නිගමන දෙකකි. එනම් එක්කෝ ඒ ධර්මය අනාදි විය යුතුය, නැත්නම් ආදියක් තිබිය යුතුය, යනුවෙනි. අනාදි හෙවත් ආරම්භයක් නැති ධර්ම පිළිගත නොහැක්කේ එවැන්නක් ස්වභාවනිත්‍ය විය යුතු බැවිනි. ආදියක් හෙවත් පෙර නොවූවක ආරම්භයක් පැනවීම අහේතුක ආරම්භයක් පිළිගැනීමකි. (අටිච්චසමුප්පන්නවාද ) එබැවින් මේ දෙකම වැරදිය. නිරපේක්ෂ ධර්මයක් පිළිගත් විට එහි අනාගත පැවැත්ම ගැනද ඇත්තේ නිගමන දෙකකි. ඒ අනුව එක්කෝ ඒ ධර්මය අනන්ත වූ අනාගත පැවැත්මකින් යුතු විය යුතුය. නැත්නම් කිසියම් අවස්ථාවක කෙළවර විය යුතුය. අනන්ත අනාගතයක සදාකාලිකව පවතින යමක් පිළිගැනීම ශාශ්වත වාදයයි. කිසියම් අවස්ථාවක කෙළවර වන ධර්ම පිළිගැනීම උච්ඡේද වාදයයි.

## හේතු ඵල සම්බන්ධතාව

ඉහත කෙටියෙන් සටහන් කළේ නිරපේක්ෂ ධර්ම ඇතැයි පිළිගැනීමේ දී බිහි වන චින්තන දුෂ්කරතාවයි. එහෙත් පවත්නා ධර්මයන්ගේ සාපේක්ෂතාව දක්නා කල්හි මේ දුෂ්කරතාව බිහි නොවන අතරම නිරවුල් චින්තනයකට පිවිසෙයි. ඒ අනුව දකින්නේ නිරපේක්ෂ ධර්ම නොව තවත් ප්‍රත්‍යයක් සමග යැපෙන ධර්මය. යමක් ඇතිවීම සිදු නොවේ. සිදුවන්නේ යමක් පවත්නා කල්හි එයට සහජාත වශයෙන් තවත් යමක පැවතීමයි. (ඉමස්මිං සති ඉදං හොති )  මෙහිදී නිදසුනක් සලකා බලමු. ස්පර්ශයේ පැවැත්ම ප්‍රත්‍යය කොට ගෙන වින්දනයේ පැවැත්ම වෙයි. එබැවින් ප්‍රත්‍ය සම්බන්ධතාව ගැන ප්‍රශ්න කරනුයේ "කුමක් පවත්නා කල්හි වින්දනය වේද?" ( කිම්හි නු බො සති වේදනා හොති ) ? යනුවෙනි. කවරෙක් වින්දනය කරයිද? කො නු බො භන්තෙ වේදනං වේදියති? යන ප්‍රශ්නය වැරදි සහගතය. ( නොකල්ලො। පඤ්හො 2. නිවැරදි වන්නේ "කුමක් පවත්නා කල්හි වින්දනය වේද?" යන්නයි. යුක්තිසහගත පිළිතුරක් ඇත්තේ ඒ

ප්‍රශ්නයවය. වින්දනය පවතින්නේ ස්පර්ශය පවත්නා කල්හිය. (ඵස්සෙ සති වෙදනා හොති ) යනු ඒ නිවැරදි පිළිතුරයි. මේ සමුදය දැක්මයි. මේ අනුව ලෝක පැවැත්මේ යථාස්වභාවය දත හැක්කේ නිෂ්පුද්ගල පැවැත්මක් ලෙසය. මේ ප්‍රත්‍ය සම්බන්ධතාවේ අභාවය දැකීම නිරෝධ දැක්මයි. වින්දනයට ස්පර්ශය ප්‍රත්‍යය වන්නේ නම් ස්පර්ශය නොපවත්නා කල්හි වින්දනය විය නොහැකිය. (ඵස්සෙ අසති වෙදනා නහොති ) නිරෝධ දැක්ම යනු මෙයයි. මේ අනුව ප්‍රත්‍ය ධර්මයන් අතර ප්‍රධානත්වයෙන් ගතහැකි කිසිවක් නොමැත. මෙහිදී නලකලාප සූත්‍රයේ සැරියුත් හිමියන් කරන ප්‍රකාශය සලකා බැලීම වැදගත්ය. යම් සේ බට මිටි දෙකක් එකනෙකට නිඃශ්‍රය වන පරිදි තබා පසුව එකක් ඉවත් කළ කල්හි අනෙක පතිත වීම සිදු වෙයිද එපරිද්දෙන් නාම, රූප, විඤ්ඤාණ ආදිප්‍රත්‍යයන් එකිනෙකට නිඃශ්‍රයව පවතින බවත් නිඃශ්‍රය වන්නට ප්‍රත්‍ය වන්නක් නොමැති කල්හි නිරෝධයට පත්වන බවත් නලකලාප සූත්‍රයේ ද සැරියුත් හිමියෝ පවසති. (එවමෙව ඛො ) ආවුසො නාමරූප නිරොධා විඤ්ඤාණ නිරොධො, විඤ්ඤාණ නිරොධා නාමරූප නිරොධො....... 3.

මෙසේ නිෂ්පුද්ගල ලෙස අකර්තෘක ලෙස ලෝක නියාමයේ ක්‍රියාකාරීත්වය දැකීම සැබෑ අනිත්‍ය දර්ශනයයි. පුද්ගලයාගේ ඉන්ද්‍රියයන්ට ගෝචර වන දේවල් කැඩෙන බිඳෙන නැසෙන දේ බව දැකීම පමණක් අනිත්‍ය දර්ශනය නොවේ. ඉන්ද්‍රියගෝචර ධර්ම නැසෙන බව සදාකාලික ස්වර්ගීය සැපතක් අපේක්ෂා කරන ශාස්වතවාදියාත් දනියි. එසේම මරණයෙන් සියල්ල කෙළවර වන බව සිතන අශාශ්වතවාදියාත් (භෞතික වාදියා) දනියි. එසේ නම් බෞද්ධයාගේ අනිත්‍ය දර්ශනය එයට වඩා විශේෂ වූවක් විය යුතුයි. ශාශ්වත වාදියා සදාකාලික වූ " මම " කෙනෙකු අපේක්ෂා කරයි. අශාශ්වතවාදියා කිසියම් අවස්ථාවක කෙළවරට පත් වන තාවකාලික " මම " කෙනෙකු අපේක්ෂා කරයි. මේ දෙකින්ම නිදහස්ව සත්වයා පිළිබඳ නාම රූප සම්බන්ධතාව නිෂ්පුද්ගල වූ ආත්මීය පැවැත්මකින් තොර ලෝකධර්මතා ක්‍රියාකාරීත්වයක් බව තේරුම් ගන්නේ බෞද්ධයාය. බෞද්ධයාගේ අනිත්‍ය දර්ශනය එයයි. පටිච්චසමුප්පාද දැක්ම එයයි. එහෙත් වින්දන අත්දැකීම්හි මුලාවූ පුද්ගලයාට මේ සත්‍යය අනාවරණය නොවෙයි.

දීඝ නිකායේ බ්‍රහ්මජාල සූත්‍රයේ සඳහන් වන්නේ බුදුරජාණන් වහන්සේ පහළ වීමට පෙර භාරතීය චින්තකයා විසින් චිත්ත සමාධින් මගින් ලැබූඥානය පදනම් කොටගෙන ගත් නිගමනයන්ය. ඒ අතර අභිඥා ශක්තීන්ගෙන් තොරව හුදු තර්කානුසාරීව (තක්කී හොති වීමංසී) දෘෂ්ටි ප්‍රකාශ කළ මහණ බමුණෝ ද වූහ. චිත්ත සමාධි ලැබූ මහණ බමුණන් වුවද ප්‍රතීත්‍ය සමුත්පාද පැවැත්ම පිළිබඳ අනවබෝධය නිසා ඉදිරිපත් කළේ දෘෂ්ටි වාදයන්ය. ඒ දෘෂ්ටීන්ට පදනම් වූ ඥානමාර්ග සිදුහත් බෝසතාණන් වහන්සේද ප්‍රගුණ කළහ. ඥානමාර්ග සත්‍ය වුවද ඒවා පදනම් කර ගෙන ගත් නිගමන සාවද්‍ය දෘෂ්ටි බව උන්වහන්සේ තේරුම් ගත්හ. භවත්‍රයට අයත් ඉහළම මානසික අවස්ථාව වන නෙවසඤ්ඤානාසඤ්ඤායතනය සිදුහත් තවුස් තුමා තේරුම් ගත්තේ රාමපුත්‍ර උද්දක වෙතිනි. එහෙත් ඒ ඥානය විමුක්තිය පිණිස නොවන බවත් එමගින් සිදුවන්නේ එම බ්‍රහ්මකායික තත්ත්වයෙහි උපත ලැබීම පමණක් තේරුම් ගත්හ. 4. බුදුරජාණන් වහන්සේ පහළ වූයේ පුබ්බෙනිවාසානුස්සතිඥානය වැනි අභිඥාවන් මගින් සංසාරය හා භවත්‍රය පිළිබඳ විෂයය දුටු ශ්‍රමණ සම්ප්‍රදායක් පැවති යුගයකය ඒ ඥානය සිදුහත් තවුස් තුමාද ඒ ඒ ආචාර්ය වරුන් ඇසුරෙන් පහසුවෙන් උපදවා ගත්හ. ඒ අවබෝධය අනුව සත්වයාගේ උසස්ම සැපත වූයේ නෙවසඤ්ඤානාසඤ්ඤායතන බ්‍රහ්ම සුඛයයි. එහෙත් එයින්ද ච්‍යුතවන සත්වයා භවරාගය ඇති බැවින් දුක් සහිතවද උපදින බව සිදුහත් තවුස් තුමා දුටුවේය. එසේ නම් එය දුකින් මිදීමක් නොවේ. නැවත නැවතත් ජරාමරණ දුකට වැටීමකි.

සිදුහත් තවුස් තුමාගේ ගමන් මග වෙනස් කළේ මේ වැටහීමයි. ලෝකය අසීරුතාවකට මුහුණ පා සිටියි. උපදියි. දිරයි. මිය යයි ච්‍යුත වෙයි. නැවතත් උපත ලබයි. ජරාමරණ දුකෙහි නිස්සරණයක් නොදනියි. කවදා නම් මේ ජරාමරණ දුකින් නිදහසක් පනවන්නේද? (කුදස්සු නාම ඉමස්ස දුක්ඛස්ස නිස්සරණං පඤ්ඤායිස්සති ජරාමරණස්සාති ) යන්න අනභිසම්බුද්ධ බෝසත් සිත තුළ ඇති වන ගැටළුවයි. මෙහිදී උන්වහන්සේ ජරා මරණ දුක පවතින්නේ කුමක් පවත්නා කල්හි දැයි යොනිසොමනසිකාරයෙන් සලකා බලන කල්හි ජරාමරණ දුක පවතින්නේ ජාතිය හෙවත් රූප වෙදනාදී ස්කන්ධයන්ගේ පිළියෙළ වීමත් චක්ඛු සොතාදී ආයතන ප්‍රතිලාභයක් ඇති කල්හි බව දුටහ. මේ අයුරින් භව - උපාදාන - තණ්හා - වෙදනා - ඵස්ස - සළායතන - නාමරූප - විඤ්ඤාණ - සංඛාර - අවිජ්ජා යන ප්‍රත්‍ය සියල්ලෙහි සාපේක්ෂ සම්බන්ධතාව දුටහ. 5. භාරතීය චින්තන ඉතිහාසයට ගෞතම බුද්ධ නමින් ශාස්තෘවරයෙකු එකතු වූයේ මේ දැක්ම නිසාය. එය භාරතීය හේතුඵල චින්තනය පැහැදිලි ලෙසම වෙනස් මගකට යොමු කළේය. බලන්න. ( Encyclopaedia of Buddhism, Vol: IV Fascicle,I. "CAUSALITY" , P , O2. ) මිනිසා තුළ ඥානමීමාංසාත්මක වශයෙනුත්, මනෝවිද්‍යාත්මක වශයෙනුත්, ආචාර විද්‍යාත්මක වශයෙනුත් නිරවද්‍ය වූද, ඵලදායි වූද, වෙනසක් ජනිත කරලීමට පටිච්චසමුප්පාද දැක්ම මූලික වෙයි. මේ දැක්මෙන් තොර ව්‍යවහාරික ලෝකයද දාර්ශනික චින්තාව මෙන්ම අතිශයින් අවුල් සහගතය.

## සමකාලීන දෘෂ්ටි හා බුදුදහම

දී. නි. බ්‍රහ්මජාල සූත්‍රයේ දෘෂ්ටි පිළිබඳ සාකච්ඡාවෙන් අවුල් සහගත චින්තනය විසින් දෘෂ්ටි නිපදවන ආකාරය දැක්වෙයි. එහි දාර්ශනික චින්තාවේ මූලික විෂයය වී ඇත්තේ ආත්මයත් ලෝකයත් ය. (අත්තා ච ලොකො ච ) " මම " නමින් සැලකිය හැකි ආත්ම ධර්මයක් මූලික වශයෙන් පිළිගෙන එහි පැවැත්ම සෙවීම, යම් යම් චිත්ත සමාධි ලැබුවද කළ නොහැකිය. ඒ පිළිගත් ආත්මයේ ආරම්භය හා අවසානය කෙබඳු ද යන ප්‍රශ්නය මතුවීම නොවැළැක්විය හැකිය. ආත්මයේ අතීත පැවැත්ම සෙවීම පූර්වාන්ත කල්පනයයි. ආත්මයේ අනාගතය පැවැත්ම සෙවීම අපරාන්ත කල්පනයයි.

පූර්වාන්ත කල්පනය පදනම් කරගෙන ශාශ්වත වාද සතරකුත්, එකච්ච ශාශ්වතවාද සතරකුත්, අධිච්ච සමුප්පන්නවාද සතරකුත් ඇති විය. අපරාන්ත කල්පනය පදනම් කරගෙන සඤ්ඤීවාද දහසයකුත්, අසඤ්ඤීවාද අටකුත්, නෙවසඤ්ඤීනාසඤ්ඤීවාද අටකුත්, උච්ඡේදවාද සතකුත් ඇති විය. මේ දෙකටම අයත් නොවන අවකාශ ලෝකය පිළිබඳ අන්තානන්තවාද සතරක්ද, කුශලය පිළිබඳ සැකය නිසා අමරාවික්ඛෙපවාද සතරක්ද, ආත්මය පරම සැපතට පත්කිරීම පිළිබඳ දිට්ඨධම්මනිබ්බාණවාද පහක් ද ඇති විය.

මේ එකක් එකක් ගැන මෙහිදී කරුණු සාකච්ඡා කළ නොහැකිය. මෙහිදී අපට වැදගත් වන්නේ පූර්වාන්ත කල්පනය හා අපරාන්ත කල්පනය තෙරුම් ගැනීමයි. ශාශ්වතවාදයේදී පූර්වාරම්භයක් දැක්විය නොහැකි අනාදි ආත්මයක පැවැත්මක් අපේක්ෂා කරයි. අධිච්චසමුප්පන්නවාදයේ දී පෙර නොවූ ' මම ' කෙනෙකුගේ ආරම්භයක් දැක්වීමෙන් අහේතුක ආරම්භයක් අපේක්ෂා කරයි. අරූපී ධ්‍යාන ඇසුරු කරගෙන සඤ්ඤීවාද ආදියේ දී ආත්මයේ අනාගත සදාකාලිකත්වයක් අපේක්ෂා කරයි. උච්ඡේදවාදයේ දී ආත්මය පිළිබඳව පැනවිය හැකි කෙළවරක් ගැන අපේක්ෂා කරයි. මේ හැම නිගමනයක් ම ආත්මයක් පිළිගැනීම නිසා බිහිවන තාර්කික වශයෙන් ද අසම්භාව්‍ය වූ දෘෂ්ටි වාදයන්ය.

ආත්මය - (මම)

| පූර්වාන්ත කල්පනය (අතීත) | අපරාන්ත කල්පනය (අනාගත) |
|---|---|
| 1. ආත්මය අනාදිය ........ (ශාශ්වත) | ආත්මයේ අනාගත පැවැත්ම අනන්තය. (ශාශ්වත) |
| 2. ආත්මයට ආදියක් ඇත ........ (අධිච්චසමුප්පන්නවාද) (අහං හි පුබ්බෙ නාහොසිං සොම්හි එතරහි අහුත්වා සන්තත්තාය පරිණතො) | ආත්මයේ කෙළවරක් ඇත. (උච්ඡේද) (සතො සත්තස්ස උච්ඡේදං විනාසං විභවං පඤ්ඤාපෙන්ති) |

අනාදි අතීතයක් හා අනන්ත අනාගතයක් ඇති ' මම ' කෙනෙකුගේ නිරපේක්ෂ පැවැත්මක් නැත. ' මම ' පිළිබඳව ආරම්භයක් පැනවිය නොහැක්කේ අහේතුක සිදුවීම් පිළිගැනීමට සිදුවන නිසයි. එය ' මම ' සම්බන්ධයෙන් නිරපේක්ෂ ආරම්භයක් අපේක්ෂා කිරීමකි. ' මම ' පිළිබඳ කෙළවරක් දැකීම නිරපේක්ෂ නිමාවක් අපේක්ෂා කිරීමකි.
(බලන්න. - Encyclopaedia of Buddhism" Vol:I., fascicle.2: , "AGNOSTICISM", P. 274)

මේ චින්තන අවුලෙන් නැගී සිටීමට මිනිසාට අවස්ථාවක් ලැබෙන්නේ පටිච්චසමුප්පාද' දැක්මක් ඇත්නම් පමණි. ලෝකධර්මතා වශයෙන් නාම රූප සමවායක පැවැත්ම තුළ ' මම ' නමින් දැකිය හැකි ධර්මයක් නැත. මේ අවබෝධය සියලු චින්තන ගැටළු නිරාකරණය කරයි. පටිච්චසමුප්පාද දැක්ම ඇති තැන පූර්වාන්ත කල්පනයට හා අපරාන්ත කල්පනයට වැටී දෘෂ්ටි ගොඩනැගීමක් සිදු නොවන බව ම. නි. මහාතණ්හා සංඛය සූත්‍රයේ පැහැදිලි වෙයි. එහිදී අවිජ්ජා, සංඛාර, විඤ්ඤාණ ආදී ප්‍රත්‍යයන්ගේ සාපේක්ෂ සමුදයත් නිරෝධයත් පැහැදිලි කරන බුදුරජාණන් වහන්සේ භික්ෂූන් අමතා මේ පැවැත්ම දන්නා කල්හි දක්නා කල්හි පූර්වාන්තයට දුවමින් දෘෂ්ටි ගොඩ නගන්නේ දැයි විමසූහ. (එවං ජානන්තා එවං පස්සන්තා පුබ්බන්තං වා පටිධාවෙය්‍යාථ) ' නැත ' භික්ෂූහු පිළිතුරු දුන්හ. මේ පැවැත්ම දන්නා කල්හි දක්නා කල්හි අපරාන්තයට දුවමින් දෘෂ්ටි ගොඩ නගන්නේ දැයි ද විමසූහ. ( එවං ජානන්තා එවං පස්සන්තා අපරන්තං වා ආධාවෙය්‍යාථ ) එයටද ' නැත ' යි පිළිතුරු දුන්හ. එසේම මේ සමුදය නිරෝධ පැවැත්ම දන්නා කල්හි දක්නා කල්හි වර්තමානයේ ' මම ' පැවැත්ම ගැන කුතුහලයෙන් සිතන්නේ දැයි ප්‍රශ්න කළහ. (එවං ජානන්තා එවං පස්සන්තා එතරහිවා පච්චුප්පන්නං අද්ධානං අජ්ඣත්තං කථංකථී අස්සථ) එයටද ' නැත ' යි පිළිතුරු දුන්හ. යමෙක් මේ දැක්මට පැමිණෙන්නේ නම් ඔවුහු ප්‍රත්‍යාත්ම වේදනීය වශයෙන් ධර්මයට එළඹුණාහු වෙතියි ද (උපනීතා) එම සූත්‍රයෙහි 6. සඳහන් වෙයි. මෙසේ සියලු සාවද්‍ය චින්තනයන්ගෙන් නැගී සිටීමට පටිච්චසමුප්පාද දැක්ම මූලික වන නිසාම එය මානව චින්තනයේ අසහාය අනාවරණය වශයෙන් සැලකිය හැකිය.

එහෙත් මේ අනාවරණය මිනිසාගේ නිරන්තර ජීවන දැක්මක් ලෙස පවත්වා ගැනීම මනුෂ්‍යයා අතින් නිසි පරිදි ඉටු වී නොමැති අවස්ථා දක්නට ලැබේ. සත්වයා විශ්ලේෂණය කිරීම් වශයෙන් මූලික බුදුසමය දක්වන ස්කන්ධ ධර්ම, ප්‍රත්‍ය ධර්ම ආදිය සාපේක්ෂ ධර්ම බව අමතක කරමින් ස්වභාව ස්වලක්ෂණ දරන බැවින් කේවල වශයෙන් පවත්නා වූ පරමාර්ථ ධර්ම සමූහයක් ලෙස විවරණය වන ආකාරය අභිධර්ම අවස්ථාවේ දී දක්නට ලැබේ. ඒ පරමාර්ථ ධර්ම ස්වභාව ස්වලක්ෂණ සහිත වන අතරම ප්‍රතීත්‍යසමුත්පාද න්‍යායටද යටත් බව කීම විසංවාදයකට වැටීමයි මහායානිකයෝ විවේචනය කළහ. කෙසේ වුවද මේ විවරණය නිසා පටිච්චසමුප්පාදය උදයත්ථගාමිනී පඤ්ඤාවක් වශයෙන් ආනුභාවික ලෙසත් ප්‍රායෝගික ලෙසත් මනුෂ්‍යයාට සම්බන්ධ වීමට තිබූ ඉඩකඩ චින්තන ඉතිහාසය තුළ ක්‍රමයෙන් නැති වී ගොස් ඇත.

## චතුෂ්කොටික තර්කනය හා පටිච්චසමුප්පාදය.

මාධ්‍යමික දර්ශනයෙහි ප්‍රත්‍ය සාපේක්ෂකත්වය පිළිගත්තද ප්‍රතීත්‍යසමුත්පාදය පාරභෞතික ස්වරූපයකින් විවරණය වීම නිසා ප්‍රායෝගික බව ඉක්මවා හුදු න්‍යායාත්මක බවකට පරිවර්තනය විය. ශාශ්වත වාදය හා අශාශ්වත වාදය යන අන්‍යොන්‍ය ප්‍රතිවිරෝධී ස්ථාවරයන්ගෙන් තොර වූ විට ප්‍රකට වන්නේ ප්‍රතීත්‍යසමුත්පාදය බව මාධ්‍යමික දර්ශනය පවසයි. ප්‍රතිවිරෝධී ස්ථාවරයන්ගේ නිශේධනය අපොහ රීතිය වශයෙන් දක්වයි. මාධ්‍යමික ස්ථාවරය උලුප්පා දැක්වීමේ දී සූත්‍රාන්තවල ඇති චතුශ්කොටි නිශේධනය උපයෝගී කර ගෙන ඇත. ඒ අනුව සත්, අසත්, සදසත්, නෛවසත් නාසත් යන චතුශ්කෝටියෙන් විනිර්මුක්ත තත්ත්වය මාධ්‍යමික ස්ථාවරයයි. 7

එහෙත් චතුශ්කොටියෙන් විනිර්මුක්තව සත්‍යය ප්‍රකට වන බවක් මූලික බුදුසමය අනුව නොපෙනෙයි. උතුම් වූ පරම අර්ථයට පැමිණි පුද්ගලයා එනම් තථාගතයන් වහන්සේ මරණින් පසු වන්නේද? නොවන්නේද? වන්නේත් නොවන්නේත් වේද? නොවන්නේත් නොම නොවන්නේත් වේද? යන චතුශ්කොටික ප්‍රශ්නය වැරදි බවත්, පංච ස්කන්ධවලින් තොරව තථාගත කෙනෙකු දැකිය නොහැකි බවත්,

එසේ දිට්ඨධම්ම වශයෙන්ම තථාගත කෙනෙකු උපලබ්ධි නොවන කල්හි මේ චතුශ්කොටික ස්ථාවරවල් හෝ එයින් බැහැරව හෝ තථාගත ගැන කථා කළ හැකි යයි කීම්සුදුසු නොවන බවත් ඇත්තේ දුකෙහි සමුදයත් දුකෙහි නිරෝධයත් පමණක් වන කල්හි සං. නි. අනුරාධ සූත්‍රයේ සඳහන් වේ. 8 පටිච්චසමුප්පාද දැක්ම නැති කල්හි ඇති කර ගන්නා චින්තන අවුල මෙයින් පැහැදිලි වෙයි. මාධ්‍යමිකයින් චතුශ්කොටි විනිර්මුක්ත සත්‍යයක් අපේක්ෂා කරන විට මූලික බුදුසමය චතුශ්කෝටියෙහි හෝ එයින් අනන්තරව සත්‍යය නොපතනවන බව දත යුතුය. චතුශ්කෝටික තර්කනය පැන නගින්නේ රූප වේදනාදී ස්කන්ධ ගැනත් 9. ඒවායේ සමුදය හා නිරෝධය ගැනත් 10. නොදන්නා බැවින 'යයි ද, භවරාගය, තණ්හාව, උපාදානය බැහැරව නොමැති බැවින් යයි ද 11. සං.නි. අව්‍යාක්ත සංයුත්තයේ සඳහන් වේ. එසේම අන්‍ය තීර්ථකයන් චතුශ්කෝටි ක්‍රමය යටතේ විමුක්ත පුද්ගලයාගේ මරණින් පසු ස්වභාවය පිළිබඳව ප්‍රශ්න කරන කල්හි බුදුන් වහන්සේ ඔවුනට පිළිතුරු නොදුන්නේ ' චක්ඛු සොතාදි ධර්ම මාගේය, මම වෙමි, මාගේ ආත්මයයි ' (එතං මම, එසො අහං අස්මිං, එසො මෙ අත්තා) ඔවුන් දෘෂ්ටි ගෙන සිටි බැවින්ය. 12.

තතු මෙසේ තිබියදී ඇතැම් විටෙක චතුශ්කෝටික තර්කනය බෞද්ධ තර්කනයක් හැටියට හැඳින්වීම සාධාරණද යන්න සලකා බැලීම බෞද්ධ දර්ශන ක්ෂේත්‍රයෙහි නියැලුනවුන්ගේ වගකීමකි නේ. එන් ජයතිලක මහතාද චතුශ්කෝටිය බෞද්ධ තර්කනයක් හැටියට සිය ' මූලික බුදුසමයේ ඥානවිභාගය ' නමැති කෘතියේ සඳහන් කරයි. ("..... the catuskoti, i.e. the Buddhist Logi/of "four alternatives" ) 13. ගුණපාල ධර්මසිරි මහතා ද සිය ' දාර්ශනික ප්‍රශ්න ' නම් කෘතියේ මේ අදහස ඉදිරිපත් කරයි. 14. ' එහෙත්, භාරතයේ පහළ වූ බුදුන් වහන්සේ කෝටි සතරකින් යුත් තර්ක ක්‍රමයක් ඉදිරිපත් කළහ. ලෝකයේ පවතින දේවල් පිළිබඳව කථා කිරීමට සතර ආකාරයක් තිබෙන බව (කෝටි හතරක්) උන්වහන්සේ කියා සිටියහ. එනිසා උන්වහන්සේගේ තර්ක ක්‍රමය චතුශ්කෝටික තර්ක ක්‍රමයක් වෙයි යනුවෙනි.

සැබැවින්ම බුද්ධිවාදී තර්කනයේ දී චතුශ්කෝටියක් වෙද්‍රවද එහි ඇත්තේ ද්වි කෝටිය පමණකි. හොති න හොති යන ඒ ද්විකෝටියයි. හොති ච න ච හොති ' යන ඒ ද්වි කෝටිය එක් තැන් කර ප්‍රතිජානනාත්මක ලෙස ප්‍රකාශ කිරීමකි. එසේ පරස්පර විරෝධී ස්ථාවර එක්තැන් කිරීම සාවද්‍යය. ' නෙව හොති නනහොති ' යනු ඉහත කී තුන්වෙනි ස්ථාවරයම ප්‍රතිශේධාත්මකව ප්‍රකාශ කිරීමකි. ද්විකෝටියට වැඩිමනත් වූවක් මෙහි නැත. මේ ද්විකෝටියට බැහැර කිරීම ද්වයනිශ්‍රිත භාවයෙන් නිදහස් වීමයි. එසේ නිදහස් විය යුත්තේ බෞද්ධ ස්ථාවරය තාර්කික උපන්‍යාසයක් නොවන නිසයි. දුකෙහි ප්‍රභවය පිළිබඳ බුදුරදුන්ට සමකාලීනව චතුශ්කෝටික ලෙස ඉදිරිපත් වූ ස්ථාවර සතරක් ගැන සූත්‍ර පිටකයේ සඳහන් වේ.

1. දුක ස්වයංකෘතය (සයං කතං දුක්ඛං)
2. දුක පරංකෘතය (පරං කතං දුක්ඛං)
3. දුක ස්වයං කෘතද පරං කෘතද වේ. ( සයං කතං පරං කතං ච දුක්ඛං)
4. දුක ස්වයං කෘතද පරං කෘතද නොවේ. ඉබේ හටගන්නකි. (අසයංකාරං අපරංකාරං අධිච්චසමුප්පන්නං දුක්ඛං)

මේ නිගමන සතර බැහැර කරන බුදුසමය දුක පටිච්ච සමුප්පන්නයයි (පටිච්චසමුප්පන්නං දුක්ඛං 15. පවසනුයේ ඒ සතර ප්‍රතික්ෂේපයෙන් ගම්‍ය වන පස් වැන්නක් හැටියට නොවේ.

සියලු දෘෂ්ටි වාදයන්ගේ සාවද්‍යතාව පෙනෙන්නේ පටිච්චසමුප්පාද දැක්ම ඇති කල්හිය. මානව චින්තනයේ අසහාය අනාවරණය ලෙස එය සැලකිය හැක්කේ එබැවිනි. බුදුදහම දාර්ශනික සංවාදයට නොව අයථාප්‍රතිපත්ති පිළිවෙතට සම්බන්ධ වූවකි. පටිච්චසමුප්පාද දැක්ම ඥානවිභාගාත්මක අංශයක් ප්‍රකට කරන අතරම එය ආචාරවිද්‍යාත්මක නැඹුරුවකින් ද යුතුය. සසුන් පිළිවෙතේ එකද ආශ්‍රවයක් වත් ප්‍රහානය නොකළ සසුනේ ප්‍රාථමික පුද්ගලයින් දෙදෙනා වන සද්ධානුසාරී සහ ධම්මානුසාරී පුද්ගලයින් දැකිය හැකි වන්නේ සද්ධා, විරිය, සති, සමාධි, පඤ්ඤා යන ඉන්ද්‍රිය යම් පමණකින් හෝ වැඩීම ඇරඹීමෙන් සමගයි. මෙහි පඤ්ඤා ඉන්ද්‍රිය නම් අනෙකක් නොව උදයත්ථගාමිනී පඤ්ඤාවයි. 16. එනම් පටිච්චසමුප්පාදයට අනුව සමුදය නිරෝධ දැක්ම ඇරඹීමයි. එය පරිසමාප්ත වන්නේ රහත් භාවයේ දිය. 17. මේ අනුව කවර ක්ෂේත්‍රයක් පිළිබඳව විශේෂඥතාවක් ලැබුවද පෘථග්ජන ජනතාවගේ චින්තනයෙන් නැගී සිටීමට මනුෂ්‍යයාට හැකි වන්නේ පටිච්චසමුප්පාද 'දැක්මට' පැමිණීමෙන් පමණි.

---

## පාදක සටහන්

01 චක්ඛුඤ්චාවුසො පටිච්ච රූපෙ ච උප්පජ්ජති චක්ඛු විඤ්ඤාණං. තිණ්ණං සංගති ඵස්සො. ඵස්ස පච්චයා වෙදනා. යං වෙදෙති තං සඤ්ජානාති. යං සඤ්ජානාති තං විතක්කෙති. යං විතක්කෙති තං පපඤ්චෙති යං පපඤ්චෙති තතො නිදානං පුරිසං පපඤ්ච සඤ්ඤා සංඛා සමුදාචරන්ති.....' -ම. නි. 1. මධුපිණ්ඩික සුත්ත.123, පිට ඤාණවිමල සංස්කරණය -

02. සං. නි. 11, මොලිය ඵග්ගුන සුත්ත. 22 - 24 පිටු, බු.ජ. -

03. සං. නි. 11, නළකලාප සුත්ත. 178 - 180 පිටු, බු.ජ. -

04. නායං ධම්මො නිබ්බිදාය, න විරාගාය, න නිරෝධාය, න උපසමාය, න අභිඤ්ඤාය, න සම්බොධාය, න නිබ්බානාය, සංවත්තති යාවදෙව නෙවසඤ්ඤානාසඤ්ඤායතනූපපත්තියා - ම. නි. 11, සඩ්ගාරව සූත්‍ර 744 පිට, බු.ජ. -

05. සං. නි. 11, ගොතම සූත්‍ර, 16 - 18 පිටු, බු.ජ. -

06. ම. නි. 1, මහාමාලුංක්‍යා සූත්‍ර, 267 - 268, පිටු, හෙ.

07. නසන්නාසන්නසදසන්නචා පානුභයාත්මකං චතුශ්කෝටි විනිර්මුක්තම් තත්ත්වම් මාධ්‍යමිකා විදුඃ - අද්වය වජ්‍ර

08. එත්ථ තෙ අනුරාධ, දිට්ඨෙවධම්මෙ සච්චතො ථෙතතො තථාගතෙ අනුපලබ්භියමානෙ කල්ලන්නු ඉත තං ව්‍යාකරණය, යො සො ආවුසො තථාගතො උත්තම පුරිසො පරම පුරිසො පරමප්පත්ති පත්තො. තං තථාගතො අඤ්ඤත්‍රිමෙහි චතූහි ඨානෙහි පඤ්ඤාපයමානො පඤ්ඤාපෙති, හොති තථාගතො පරම්මරණා......... නෙව හොති න නහොති තථාගතො පරම්මරණාතිවාති? නොහෙතං භනතෙ. සාධු සාධු අනුරාධ පුබ්බෙ චාහං අනුරාධ එතරහිච දුක්ඛඤ්චෙව පඤ්ඤපෙමි දුක්ඛස්සච නිරොධනති

- සං. නි. 4. අනුරාධ සූත්‍ර, 680 පිට, බු.ජ.

09. සං. නි. 4. ආරාම සූත්‍ර, 688 පිට, බු.ජ. -

10. - එම -

11. - එම -

12. සං. නි. 4, ආයතන සූත්‍ර, 692 පිට, බු.ජ

13. K.N. Jayatilleke. - Early Buddhist Theory of Knowledge.

P: 350.

14. ගුණපාල ධර්මසිරි මහතා - දාර්ශනික ප්‍රශ්න 8 පිටුව

15. සං. නි. 11, අචෙල කස්සප සූත්‍ර, 32 -34 පිටු, බු. ජ.

16. ඉධ භික්ඛවෙ අරියසාවකො පඤ්ඤවා හොති උදයත්ථගාමිනියාපඤ්ඤාය සමන්නාගතො අරියාය නිබ්බේධිකාය සම්මා දුක්ඛක්ඛයගාමිනියා - සං. නි. 5 (1), දුතියවිභංග සූත්‍ර, 354 පිට, බු. ජ

17. ඉමෙසං ඛො භික්ඛවේ පඤ්චන්නං ඉන්ද්‍රියාන සමත්තා පරිපූරත්තා අරහං හොති. සං. නි. 5 (1), දුතියසංඛිත්ත සූත්‍ර, 356 පිට, බු.ජ.